**<u>සාධාරණ සමාජයක් සඳහා වන ජාතික ව්‍යාපාරයේ මූලිකත්වයෙන් සංවිධානය කෙරුණු විපක්ෂයේ ඒකාබද්ධ සංවාදය සඳහා පදනම් වුණු ලේඛනය:</u>**

## <u>රට ඉදිරියේ ඇති මහා අභියෝග හමුවේ මහා සම්මුතියක් සඳහා</u>

**අපේ අර්බුදය**

ශ්‍රී ලංකාව මුහුණ දී සිටිනුයේ නිදහස ලැබූ දා පටන් මුහුණ දුන් දරුණුතම අර්බුදයටයි. සමස්ත සංස්කෘතිය, දේශපාලනය, ආර්ථිකය සහ සමාජ ක්‍රමය නිදහසින් පසුව මුහුණ දෙන විශාලතම අර්බුදයට අද රට මුහුණ දී තිබේ.

රටේ සියලු දේශපාලන බලතල විධායකය යටතට ගෙන ආ විනාශකාරී විසි වන සංශෝධනය හේතුවෙන් එතෙක් අත්තනෝමතික ලෙස ආණ්ඩුව විසින් ගෙන ගිය පාලනයට නීතිමය භාවයක් ලබා දී තිබේ.

දශක ගණනාවක් තිස්සේ උඩින් ඔප කරමින් පවත්වාගෙන ආ ආර්ථිකය යටින් හපයක් වී අවසානය. පැලැස්තර ආර්ථික විසඳුම් තව දුරටත් වලංගු නැති බව ඔප්පු වී හමාරය.

සමස්ත සමාජ ක්‍රමයේ වෙනසක් ඉහළ සිට පහළට ද, පහළ සිට ඉහළට ද අවශ්‍ය බව දිනෙන් දින උග්‍ර සංස්කෘතික පරිහානිය, නාස්තිය සහ දූෂණය, පරිසර සංහාරය මෙන්ම අධ්‍යාපන, සෞඛ්‍ය සහ කෘෂිකර්ම අර්බුද මගින් පෙනී යයි.

**කළ යුත්තේ කුමක්ද?**

මේ මහා ව්‍යසනයට මුහුණ දීම පිණිස ජනතාවගේ මහා සම්මුතියක් අවශ්‍ය වේ. ආගම, ජනවර්ගය, හෝ දේශපාලන ලැදියාවන් නොතකා, රට දැන් වැටී ඇති අගාධයෙන් ගොඩ ගැනීමට:

1. ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම පිණිස අදූරදර්ශී ආර්ථික කළමනාකරණය සහමුලින් වෙනස් කළ යුතුය. වර්ෂ ගණනාවක් තිස්සේ විවිධ ආණ්ඩු යටතේ ගොඩ ගැසුණු ණය කන්දරාව ආපසු ගෙවීමේ අභියෝගය 2019 වර්ෂයේ සිට උච්ච තත්වයකට එන බව වගකිවයුත්තන් නොදැන සිටියා නොවේ. එබැවින්:
    - සාධාරණත්වය සහ කාර්යක්ෂමතාව තුලනය කරමින් රටේ ආර්ථික ප්‍රමුඛතා හඳුනා ගැනීම අවශ්‍යය;
    - නාස්තිය සහ දූෂණය අවම කිරීමට සැබෑ කැපවීම පෙන්විය යුතුය අතර ආයතනික රාමුව ශක්තිමත් කිරීමෙන් එය තහවුරු කළ යුතුය;
    - සැබෑ සුදුස්සන් තනතුරුවලට පත් කිරීම පෙරදැරිව ඵලදායිත්වය වර්ධනය කිරීමට කටයුතු කළ යුතුය;
    - ජනතාවගේ ජීවන බර සැහැල්ලු කරන අතර රාජ්‍ය ආදායම තහවුරු කරන බදු ක්‍රමයක් අවශ්‍යය.

2. විනාශකාරී 20 වන සංශෝධනය ආපසු හරවා ප්‍රජාතන්ත්‍රවාදයේ ස්ථාවරත්වය තහවුරු කළ යුතුය:
    - මැතිවරණ කොමිසම ඇතුළු කොමිසම් සභාවලට දේශපාලන හිතවතුන් වෙනුවට අපක්ෂපාතී ප්‍රාමාණිකයන් පත් කිරීමට වහා කටයුතු කළ යුතුය;
    - පාර්ලිමේන්තුවේ ස්වාධීනත්වය විධායකයේ ග්‍රහණයෙන් මුදාලිය යුතුය;
    - ව්‍යාවස්ථා සභාවේ දේශපාලන තුලනය සහ ස්වාධීනත්වය තහවුරු කළ යුතුය;
    - රාජ්‍ය සේවය දේශපාලනීකරණට සහ මිලිටරීකරණයට ඇති ඉඩ අවුරාලිය යුතුය.

3. අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කළ යුතුමය.

    - ඉහළ අධිකරණයවලට විනිසුරුවන් පත් කිරීමට විධායකය සතු අත්තනෝමතික බලය අධීක්ෂණයට යටත් කළ යුතුය;

    - අධිකරණයට සිදු කරන සියලු අත පෙවීම් වළැක්වීමට යාන්ත්‍රණයක් තැනිය යුතුය.

4. මානව හිමිකම් තහවුරු කරමින් සෑම පුද්ගලයකුට, ප්‍රජාවකට සහ ජන කොටසකටම තෘප්තිමත් විය හැකි පරිදි අයිතිවාසිකම් ස්ථාපනය කළ යුතුය.

    - සෞඛ්‍ය බලධාරීන් විසින් සම්පාදිත වසංගත පාලන නීති නිසි ලෙස නීතිගත කරමින්, ඒවා ජනතා හඬ මැඩලීම පිණිස අවභාවිත කිරීම වහා නවතා දැමිය යුතුය;

    - අධ්‍යාපන, පරිසර, කෘෂිකර්ම ආදී ක්ෂේත්‍රවල ගැටලු පෙන්වා දෙන ක්‍රියාකාරීන් මර්දනය නැවැත්විය යුතුය;

    - සමාජ මාධ්‍ය සහ ජන මාධ්‍ය මර්දනයට සහ වාරණයට විරුද්ධ වෙමු. ස්වාධීන මාධ්‍ය නියාමනයක අවශ්‍යතාවය අවධාරණය කරමු.

උක්ත කාරණා සම්බන්ධයෙන් මූලික එකඟතා ඇති කර ගනිමින් ජනතා සුභසිද්ධිය තහවුරු කළ හැකි ශක්තිමත් සහ ආරක්ෂිත දේශයක් ලෙස ශ්‍රී ලංකාවට නැගී සිටීමට අවශ්‍ය අඩිතාලම තැනීම අද අපි අරඹමු!

## For Great Solidarity in the face of Great Challenges facing the Country

**Our Challenges**

Sri Lanka is facing the worst crisis since Independence. Its roots are spread to spheres of culture, politics, economy and society as a whole.

The catastrophic Twentieth Amendment to the Constitution, which subjugated the total political power in the country under the control of the executive, has given 'legal cover' to the arbitrary conduct of the government.

The 'all-glitter but no substance' solutions to real problems of the economy do not work anymore. Temporary economic solutions have proven to be no longer valid.

The need for change in the entire social system from top to bottom and from bottom to top is manifest in the increasing cultural decline, waste and corruption, environmental destruction as well as the education, health and agricultural crises.

**What needs to be done?**

The country needs great solidarity of the citizens to overcome these challenges. To get the country out of the abyss it has now fallen into, we must rise above divisions based on religion, ethnicity or political affiliation, to:

1. Unscrupulous economic management must be completely changed to overcome the economic crisis. Those who were managing the economy were not unaware that the challenge of repaying the huge amount of debt that had accumulated under various governments over the years would peak in 2019, and beyond. Therefore:

    - The country's economic priorities must be identified while balancing fairness and efficiency;

    - The commitment to end waste and corruption must be reinforced by strengthening the required institutional framework;

- A true meritocracy should be established with productivity in focus;
- Introduction of tax reforms to ease the burden on the people while ensuring government revenue.

2. The disastrous 20th Amendment must be reversed to ensure the stability of democracy:
    - Immediate action should be taken to appoint impartial dignitaries to the commissions, including the Election Commission, instead of political allies;
    - The Parliament must be freed from the undue grip of the Executive;
    - Ensure political balance and independence of the Constituent Council;
    - Politicization and/or militarization of the public service must be prevented.

3. The independence of the judiciary must be ensured.
    - The arbitrary power of the executive to appoint judges to the higher courts should be subjected to review;
    - A mechanism should be set up to prevent all forms of interference in the judiciary.

4. Human rights must be upheld to ensure the satisfaction of every individual, group and community.
    - The health guidelines compiled by the health authorities should be properly enacted and their misuse to suppress the voice of the people should be ended;
    - Stop the repression of activists who raise their voice against injustices in the fields of education, environment, agriculture, etc.;
    - The repression and censorship of social media and mass media must be ended. The need to establish an independent media regulation mechanism is emphasized.

Today, by reaching a preliminary agreement on the above issues, we begin to lay the foundations for Sri Lanka to emerge as a strong and secure nation that can ensure the well-being of the people!